# මහින්දත් එපා, රනිලුත් එපා - මහින්ද ඕනේ

මහින්ද රාජපක්ෂ පාලනයට එකඟ නැත. ඊට හේතු වශයෙන්, දූෂණය සහ භීෂණය, ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් අඩු වශයෙන් 13 වන ව්‍යවස්ථා සංශෝධනය නැමැති කඩදාසි කෑල්ලවත් අතට නො ගැනීම සහ මර්වින් සිල්වා නැමැති අන්වර්ථ නාමයකින් හැඳින්වෙන පාදඩ දේශපාලන සංස්කෘතිය ප්‍රසිද්ධියේ ආරක්ෂා කිරීමට අමතර ව, මාධ්‍ය මර්දනය සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මැඩලීම වැනි තවත් මෙ කී නො කී බොහෝ කරුණු ගෙනහැර දැක්විය හැක. ඒ සමග ම, මම රනිල් වික්‍රමසිංහ ගේ එක්සත් ජාතික පක්ෂයට ද එකඟ නො වෙමි. මගේ කතාවේ වැදගත් අංගය වන්නේ එය යි. එ සේ වුවත්, රනිල් වික්‍රමසිංහ ව ප්‍රතික්ෂේප කිරීම සඳහා ඉහත සඳහන් දීර්ඝ දෝෂ දර්ශන මාලාගත කිරීමේ අවශ්‍යතාවක් මට මතු වන්නේ නැත. එක්සත් ජාතික පක්ෂය යනු සමාජ - දේශපාලනික අන්ත ප්‍රතිගාමිත්වය මිස වෙනකක් නො වේ යැයි කෙටියෙන් ලේබල් කිරීම, පවතින සමාජ කථිකාව තුළ, හොඳට ම සෑහෙන බැවිනි.

දැන්, මම යනු කවරෙක් ද? මහින්ද රාජපක්ෂ අරහයා ඇතැම් කාරණා සම්බන්ධයෙන් මතවාදීමය විවේචනයක් දරන එහෙත් එම පාලනය අකුරක් ගානේ ප්‍රායෝගික වශයෙන් ආරක්ෂා කරන රාජපක්ෂවාදියෙක්මි. මා වනාහී මගේ ඇඟේ මවිලක් ගානේ ම රාජපක්ෂවාදියකු මිස, සමාජ සාධාරණත්වය, ජාතීන් අතර සමානාත්මතාව සහ ප්‍රජාතන්ත්‍රවාදය වැනි සාර්ගර්භ සංකල්ප වෙනුවෙන් පෙනී සිටින, දවල් මිගෙල් ද් දනියෙල් කෙනෙකුට වෙනස් නැති, අසරණයකු නො වන වග, මගේ තර්කනය තුළ පැහැදිලි කිරීමට මට අවසර.

ප්‍රශ්නයක් ද්වි-විධ නම් විසඳුම ලෙහෙසි ය. එහෙත් අවාසනාවකට මෙන්, 'සුදු' නැත් නම් 'කළු' ආදී වශයෙන් වන එ වැනි ප්‍රශ්න අද බෙහෙතකට වත් හොයා ගැනීමට නැත. ඒ තරමට, සමාජ ප්‍රශ්න සංකීර්ණ ය. එ බැවින්, 'මහින්ද නැති නම් රනිල් තමයි' යන්න වලංගු නැති බව සහසුද්දෙන් ම සැබෑ ය. මහින්දත් නැති, රනිලුත් නැති දේශපාලනික අවකාශයන්, සංකල්පමය වශයෙන් පමණක් නො ව, ප්‍රායෝගික වශයෙනුත් තිබිය හැකි බැවිනි. (උදාහරණයක් වශයෙන් වමේ විකල්පයක ඇති න්‍යායික විභවය සැලකිල්ලට ගත හැක. ඒ ගැන ඊ ළඟ ලිපියේ සාකච්ඡා කෙරේ).

එ සේ තිබියදීත්, මහින්ද ව 'විවේචනය' කරන අතරේ රනිල්ටත් 'විරුද්ධ' වන්නා, දවල් මිගෙල් ද් දනියෙල් කෙනෙකු යැයි මා කියන්නේ ඇයි?

ප්‍රතිගාමීත්වය සහ ප්‍රගතිශීලීත්වය යනු ලංකාව සම්බන්ධයෙන් කුමක් ද යන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය සම්බන්ධයෙන් මේ කොලමේ අනේක වර විස්තර කෙරී ඇත. එක්සත් ජාතික පක්ෂය ප්‍රතිගාමී යැයි පිළිගන්නා අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රතිගාමී නො වන්නේ කෙ සේ ද යි කෙනෙකුට පැහැදිලි කර දෙන ලෙසත් අනේක වර

ඉල්ලා ඇත. එහෙත් මේ දක්වා ඒ සඳහා පැහැදිලි නිර්වචනයක් ලැබී නැත. අද වන විට මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ආරක්ෂා කළ යුත්තේ මන්ද යන්නට අවංක වූත්, නිවැරදි වූත් පිළිතුරක් දෙන්නේ පුද්ගලයන් දෙන්නෙකු පමණි. ඒ, චම්පික රණවක සහ විමල් වීරවංශ ය. ඔවුහු නිවැරදි ය. මහින්ද යනු, සිංහල-බෞද්ධ රණකාමීත්වය මෝඩ කමට හෝ අවංක ව පිළිගන්නා, මෙ තෙක් බලයට පත් වූ එක ම නායකයා ය. ඉතිං, සිංහල-බෞද්ධ සකල බලවේග ඔහු වටා ඒකරාශි විය යුතු යැයි පැවසීම වරදක් නො වේ. එහෙත් මහින්ද පිළිබඳ මේ හැඳින්වීම පිළිනොගන්නා, ඊනියා වාම බුද්ධිමතුන් වැටෙන්නේ මොන ගණයට ද?

ගැටලුව අපි මෙ සේ ගොනු කර ගනිමු. මහින්ද සහ රනිල් අතර ඉහත සඳහන් වර්ගීකරණීය, විභේදනය හැම විටක ම දිග හැරෙන්නේ ඉහත කී අනුපිළිවෙලට ම ය. එ නම්, පටන් ගන්නේ, මහින්ද ගෙනි. එ නම්, මහින්ද ව 'නිර්දය' විවේචනය කිරීමෙන් හෙවත් පවතින යථාවට පහර දීමෙනි. මේ පවතින යථාව හෙවත් මහින්ද ව විවේචනය කිරීමෙන් අනතුරුව යි, "ඒත්" යන්න (වර්තමාන කාරණයට අදාළ බුද්ධිමය කථිකාවේ පැනෙන වඩාත් අවස්ථාවාදී නිපාතය) අතරමැදට පැමිණ, රනිල් ව සහ එක්සත් ජාතික පක්ෂයත් ප්‍රතික්ෂේප කිරීම ඉදිරිපත් කෙරෙන්නේ. මෙය 'ප්‍රගතිශීලී' බුද්ධිමය භාවිතාවක් වශයෙන් සැලකේ. (අහවල් මධ්‍යස්ථ බුද්ධිමතා රනිල් ව සේ ම, රාජපක්ෂ වත් විවේචනය කරති යි එ විට දනෝ කියති).

දැන් මේ අනුපිළිවෙල, එ නම් ප්‍රශ්නය ගොනු කිරීමේ අනුපිළිවෙල, බැරි වෙලාවත් මේ කිසි බුද්ධිමතෙකු අතින් ලියැවෙන ඔවුන්ගේ විදග්ධ ලේඛනයන් තුළ අඩු වශයෙන් එක වරක් වත් වෙනස් වී නැත්තේ ඇයි? එ නම්, මුලින් ම, නො පැවැත්ම හෙවත් රනිල් ව සහ එක්සත් ජාතික පක්ෂය විවේචනය කොට, "ඒත්" යන වචනය ඒ අතරට යොදා, ඉන් පසු පැවැත්ම හෙවත් මහින්ද ව ප්‍රතික්ෂේප කිරීම නො එන්නේ ඇයි? (රනිල් ප්‍රතිගාමියෙකි. එක්සත් ජාතික පක්ෂය යනු බටහිර ප්‍රාග්ධනයේ බළල් අතකි, යනාදී වශයෙන් ගෙනහැර පෑමෙන් පසු ව, "ඒත්" මහින්දත් ඊට වෙනස් නැත, ඔහු ද අවස්ථාවාදියෙකි, බලලෝභියෙකි, මානව හිමිකම් උල්ලංඝනය කරන්නෙකි, ව්‍යවස්ථාව තුට්ටුවකට වත් මායිම් නො කරන්නෙකි... ආදී වශයෙන් තර්ක කොට, ඔහු ඉවත් කිරීම අද දවසේ කාර්ය භාරය වශයෙන් ඉදිරිපත් නො කෙරෙන්නේ ඇයි?).

ඥාන විභාගාත්මකවත්, තර්ක ශාස්ත්‍රානුකූල වත්, එ සේ ප්‍රශ්නය ගොනු කිරීම ස්වකීය අභිමතයට පටහැනිව සිටින බැවිනි. මෙ තැන දී කෙරෙන්නේ, එකෙකු විවේචනය කෙරෙන අතරේ, එ නම් පවතින මහින්ද ව විවේචනය කෙරෙන අතරේ, අනිකා ව එ නම් නො පවතින රනිල් ව ප්‍රතික්ෂේප කිරීම යි. එකක් විවේචනයකි. අනික ප්‍රතික්ෂේප කිරීමකි. විවේචනය කෙරෙන්නේත්, ප්‍රතික්ෂේප නො වන්නේත්, වර්තමානය යි. ඒ හරහා එම වර්තමාන පැවැත්ම 'නිර්දය විවේචනය' මධ්‍යයේම හෙටටත් ආරක්ෂා කෙරෙන්නේ ය.

මෙ සේ වන කල, 'බලය බෙදාහැරීම' ගැන න්‍යායාත්මක ලේඛනකරණයේ යෙදෙමින්, දේශපාලන විසඳුමක ඇති වැදගත් කම පිළිබඳ දේශන පවත්වමින් සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම පිළිබඳ ව ජනාධිපතිවරයා ව වගඋත්තරකරුවකු කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට යන අතරේ ම, කෙනෙකුට එම ජනාධිපතිවරයා වෙනස් කිරීමට විරුද්ධ වත් පෙනී සිටිය හැක. ඒ ඉතා සරල තර්කයක් මත ය. එ නම්, ස්වකීය ප්‍රගතිශීලී-ප්‍රතිගාමී දෙබෙදුම තුළ, අනුප්‍රාප්තිකයා (රනිල්) ප්‍රතිගාමියෙකු වීම ය. මේ තර්කනය තුළ, මාධ්‍ය දඩයම, සුදු වෑන් සංස්කෘතිය, හමුදාමය විසඳුම් සහ සමාජය හමුදාකරණයට ලක්වීම, මහජන දේපළ කොල්ලකෑම, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම, දූෂණය සහ නාස්තිය, කලා = සංස්කෘතික දේහය පුරා ප්‍රචණ්ඩ ආකාරයෙන් මුදාහැරෙන ආගමික = සදාචාරමය මූලධර්මවාදය ඈ කිසිවක්, ප්‍රතිගාමී ලේබලය සඳහා මොන විදිහකින් වත් නො සෑහෙන්නේ ය.

ඉතිං, මහින්ද රාජපක්ෂ මැතිතුමා තව සුවාසූ කල්පයක් ජනාධිපති පදවියේ වැජඹේවා! එ විට මට, 13 සහ 17 වෙනුවෙන් ද, ජාතීන් අතර සමානාත්මතාව වෙනුවෙන් ද ඒ සා කාලයක් ම පෙනී සිටිය හැකි වන්නේ ය.